# Analysis of the layers of the mind included in Sigmund Freud's psychoanalytic theory and the threefold evolution of *Yōgāchāra*

## සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ගේ මනෝවිශ්ලේෂණ න්‍යායෙහි ඇතුලත් මනසේ ස්ථර පිළිබඳ විග්‍රහය හා යෝගාචාර ත්‍රිවිධ පරිණාමය

Karapikkada Sobitha

සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ගේ මනෝවිශ්ලේෂණ න්‍යායෙහි මූලික සංකල්ප අතර මනස පිළිබඳ ස්ථර තුනක් දක්වයි. ඒ අනුව පුද්ගල මානසිකත්වය සවිඥානය, උපවිඥානය, අවිඥානය යනුවෙන් අවස්ථා තුනකි. මෙහි සවිඥානය ලෙස දැක්වූයේ පුද්ගලයාගේ උඩුසිත හෙවත් මේ මොහොතේ පවතින්නා වූ සිතයි. පුද්ගල මතකයෙහි, අවධානයෙහි හා සංජානනයේ පවතින සිතුවිලි මෙහි ඇතුලත් වේ. එසේම උපවිඥානය යනු සිහියට කැඳවාගත හැකි යටගියාවයි. එනම් උපවිඥානය සවිඥානික නොපැවතිය ද එහි පවතින්නා වූ සිතුවිලි අපහසුතාවකින් තොරව මතකයට නැන්විය හැකිය. ෆ්‍රොයිඩ්ගේ මනස පිළිබඳ ස්ථර වර්ගීකරනයේ ඉතා වැදගත් වූ අවස්ථාව අවිඥානයයි. එනම් මනසේ ගැඹුරුම කොටසයි. පහසුවෙන් සිහියට කැඳවිය නොහැකි යටගියාවයි. සියලු මානසික ශක්තීන්වල උපත ලෙස මෙම අවස්ථාව ෆ්‍රොයිඩ් දක්වයි. පුද්ගලයාගේ සාමාන්‍ය සම්ප්‍රජානනයෙන් එපිට මනසේ නිදන්ගතව පවතින සිතුවිලි, ප්‍රේරණ, ආවේග සහ අපේක්ෂාවන් මෙම  ස්ථරය තුළ සංයුක්ත වේ. මිනිසාගේ චර්යාවන් හැසිරවීමේ කාරකය ලෙස ද මෙම අවස්ථාව තවදුරටත් ෆ්‍රොයිඩ් විසින් විස්තර කොට ඇත. ෆ්‍රොයිඩ්ගේ මෙම ඉදිරිපත් කිරීම බෞද්ධ යෝගාචාර ත්‍රිවිධ පරිණාමයට යම් ගැලපීමක් දැකගත හැක. යෝගාචාරීන් ත්‍රිවිධ පරිණාමය ලෙස විග්‍රහ කරනුයේ ද මනසේ ස්ථර තුනක් පිළිබඳවය. එනම් ප්‍රවෘත්ති විඥානය, මනන විඥානය, ආලය විඥානය යන අවස්ථාවන් තුනයි. මෙයින් ප්‍රවෘත්ති විඥානය යනු ෂඩ් ඉන්ද්‍රියයන් මඟින් ලබන්නා වූ විඥානයයි. එය සවිඥානිකව පවත්නා වූ තත්ත්වයක් බැවින් ෆ්‍රොයිඩ්ගේ සවිඥාන අවස්ථාවට බොහෝ සෙයින් සමාන වේ. එසේම ත්‍රිවිධ පරිණාමයේ දෙවන අවස්ථාව වන මනන විඥානය යනු ප්‍රවෘත්ති විඥානය ක්‍රියාත්මකවීම සඳහා උපයුක්ත ක්ලේෂ ධර්ම තැන්පත් මූලික අවස්ථාවයි. යෝගාචාරීන්ට අනුව මෙම අවස්ථාව තුළ ස්පර්ශ, මනසිකාර, වේදනා, සඤ්ඤා, චේතනා යනුවෙන් චෛතසික පහක් ද, ආත්මදෘෂ්ටි, ආත්මමාන, ආත්මස්නේහ, ආත්මසංඥා යනුවෙන් ක්ලේෂ ධර්ම හතරක් ද ඇතුලත් වේ. මෙම ඉගැන්වීම ද ෆ්‍රොයිඩ්ගේ උපවිඥාන විග්‍රහයට සාපේක්ෂකව, එය බෞද්ධ මුහුණුවරකින් දක්වා ඇති අයුරු පෙනේ. යෝගාචාරීන්ගේ මනස පිළිබඳ පූර්ණ විග්‍රහය දැක්වෙන්නේ ආලය විඥානය තුළිනි. සංස්සාරගතව පුද්ගලයා විසින් නිර්මාණය කරගනු ලබන කර්ම, ක්ලේෂ, ස්මෘති බීජයෝ තැන්පත්ව ඇත්තේ ආලය විඥානය තුළය. එය ගැඹුරු වූ මානසික අවස්ථාවක් ලෙස විග්‍රහ කරන්නා වූ යෝගාචාරීන් පුද්ගල සාංසාරිකත්වයේ කෙලවර තෙක් මෙහි පැවැත්ම අවධාරණය කරනු ලබයි. එසේම මනන විඥානයේ ක්‍රියාකාරීත්වය සඳහා බීජ සපයනු ලබන්නේ ද මෙම ආලය විඥානය තුළිනි. පුද්ගල මනෝභාවයන් තැන්පත් වී අවශ්‍ය අවස්ථාවක ප්‍රවෘත්ති විඥානයේ ක්‍රියාකාරීත්වය සඳහා බලපානු ලබන බැවින් මෙම විඥාන අවස්ථාව ෆ්‍රොයිඩ්ගේ අවිඥාන ස්ථරයට බොහෝ සෙයින් සමාන කමක් දක්වයි. නමුත් එහි පැවැත්ම පිළිබඳ විශ්ලේෂණයේ දී මෙම ඉගැන්වීම් දෙක අතර යම් පරස්පරභාවයක් හඳුනාගත හැක. අපගේ මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් ෆ්‍රොයිඩ්ගේ මනසේ ස්ථර පිළිබඳ විග්‍රහය හා යෝගාචාර ත්‍රිවිධ පරිණාමය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් කිරීමට අපේක්ෂිතය.

ප්‍රමුඛ පද ඃ සවිඥානය, උපවිඥානය, අවිඥානය, ත්‍රිවිධ පරිණාමය, ක්ලේෂධර්ම